www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නාවික සිද්ධීන් එක්සත් ජනපද-චීන සබඳතා තුල පවතින ආතතීන් විදහා දක්වයි.

## Naval incidents highlight tense US-China relations

**ජෝන් චාන් විසිනි**
**2009 මාර්තු 12**

එක්සත් ජනපද (එ.ජ) සහ චීන නෞකා අතරේ පසුගිය සතිය තුල ඇති වූ නාවික පොරබැදීම් ගනනාවක් දෙරට අතර ආතතීන් ඉහල යාමකට තුඩු දුන්නේය. ඊයේ වොෂින්ටනයේ දී එ.ජ. රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් සහ චීන විදේශ අමාත්‍ය යැන් ජියෙචි අතර සාකච්ඡාව තුල දී ප්‍රශ්නය යටගිය නමුදු, මෙම සිද්ධීන් නාටකාකාරව පුපුරා යා හැකි ඝර්ෂනයන් එලිදරව් කරයි.

පෙන්ටගනයට අනුව, ගිය බදාදා කහ මුහුදේ යාත්‍රා කල යූඑස්එන්එස් වික්ටෝරියස් නම් විමර්ශනාත්මක නෞකාව ආලෝකමත් කරන්නට චීන ධීවර සංචාරක බෝට්ටුවක් එල්ල කර ඇති දීප්තිමත් ආලෝක ප්‍රවාහයක් සිද්ධියේ ආරම්භය විය. පසුදින, චීන Y-12 නාවික විමර්ශනාත්මක අහස් යානාවක් මීටර් 120 ක පමන උසකින් නෞකාව මතින් 12 වතාවක් කඩිමුඩියේ එහා මෙහා පියාසර කලේය.

චීනයේ ආන්දෝලනාත්මක හයිනන් දූපත අසල දකුනු චීන මුහුදේ යාත්‍රා කල යූඑස්එන්එස් ඉම්පෙකබල් නම් තවත් නෞකාවක් සිද්ධියට සම්බන්ධ විය. චීන මධ්‍යම ප්‍රමානයේ යුද නැවක් අනතුරු ඇඟවීමක් නොමැතිව ඉම්පෙකබල් නෞකාවට මීටර් 90ක් ඉදිරියෙන් හරස් අතට යාත්‍රා කල බව එ.ජ. මිලිටරිය ගිය බ්‍රහස්පතින්දා ප්‍රකාශ කලේය. පැය දෙකකට පසුව, Y-12 ගුවන් යානාවක් ඉතා පහලින් නෞකාවට ඉහලින් එහා මෙහා ගොස් ඇත. සෙනසුරාදා දින, ඉම්පෙකබල් නෞකාවට ප්‍රදේශය අතහැර යන ලෙසත් එසේ නැත්නම් "විපාක භුක්ති විඳින ලෙසත්" චීන නෞකාවකින් රේඩියෝ පනිවුඩ යැවීය.

වඩාත්ම බරපතල සිද්ධිය ඇතිවූයේ ඉරිදා දිනයේ දී ය. නැවතත් පෙන්ටගනය වාර්තාකරන ලෙසට, ඉම්පෙකබල් නැව එම ප්‍රදේශයෙන් එලවා දැමීමේ පැහැදිලි උත්සාහයක නිරත වෙමින්, කුඩා චීන නෞකා පහක් ඉම්පෙකබල් නැවට "ඉතා සමීපයෙන් මුර සේවාවේ යෙදෙමින් ප්‍රචන්ඩකාරීව හා අනතුරුදායී ලෙස" හැසිරවීය. චීන නෞකාවෙතට බට මගින් ජලය විදිමින් එ.ජ. නාවික කාර්ය මන්ඩලය ප්‍රතිචාර දැක්වීය. චීන නෞකා දෙකක් එහි ගමන් මාර්ගය වලකමින් මුහුදට සුන් බුන් හෙලීමෙන් පසුව සට්ටනයක් වලක්වාලීමට ඉම්පෙකබල් නැවට ගමන නැවැත්වීමට සිදුවිය.

ඊයේ සන්නද්ධ සේවා සෙනෙට් කමිටුව ඉදිරියේ සාක්ෂි දෙමින්, එ.ජ. ජාතික ඔත්තුසේවා අධ්‍යක්ෂ ඩෙනිස් බ්ලෙයාර් මෙම මුහුනදීම විස්තර කලේ, 2001 දී චීන ගුවන් නියමුවෙකුට මරු කැඳවමින් සහ ඇමරිකානු ඔත්තුසේවා ගුවන් යානාවක් හයිනන් දූපතට බලෙන් ගොඩබෑස්සවීමට තුඩුදුන් අහසේ ඇතිවූ සට්ටනයෙන් ඉක්බිතිව රටවල් දෙක අතර සිදුවූ "වඩාත්ම බරපතල" මිලිටරි ආරවුල බවයි.

පෙන්ටගනයේ ප්‍රකාශක ස්ටීවන් අප්ටන් ප්‍රකාශ කලේ, "මෙම ප්‍රදේශයේ චීන නෞකා සහ ගුවන් යානා සාමාන්‍ය පුරුද්දක් ලෙසට එජ නාවික හමුදා නැව් අසලින් ගමන් කිරීම හෝ පියාසර කිරීම කරනවා. කෙසේ වුවත් මෙම ක්‍රියාවන් අප දකින ආකාරයට වඩා සැලකිය යුතු ලෙස ප්‍රචන්ඩකාරී සහ වෘත්තීමය නොවන අතර සට්ටනයක හෝ වැරදීයාමක අවදානම බරපතල අන්දමට ඉහල නගිනවා." සියලු එ.ජ. නාවික හමුදා නැව් ජාත්‍යන්තර මුහුදේ ක්‍රියාත්මක වන බව ඔහු දැඩිව පැවසීය.

චීන බලධාරීන් සිද්ධිය සම්බන්ධව විස්තර සැපයුවේ නැති නමුත්, මුහුද යට සබ්මැරීන ද ඇතුලත් වූ ප්‍රධාන නාවික කඳවුරක් පිහිටි හයිනන් දූපතෙහි මිලිටරි පහසුකම් ගැන ඔත්තු බැලීමෙහි එ.ජ. නෞකා නිරතවන බවට චෝදනා කලේය. තවදුරටත්, තම වෙරල තීරයේ සිට නාවික සැතපුම් 200 දක්වා විහිදෙන චීනයේ සුවිශේෂී ආර්ථික කලාපය තුල එවැනි ඔත්තු බැලීමේ ක්‍රියාකාරකම් ජාත්‍යන්තර නීතිය යටතේ තහනම් බව බීජිං දැඩිව කියා සිටියේය. ඉම්පෙකබල් නෞකාව නාවික සැතපුම් 70 ක් හයිනන් දූපතට දකුනින් සිටියේය. එ.ජ.ය ජාත්‍යන්තර සාගර නීතියට

අත්සන් නොකල රටක් වුවත් චීනයේ පැහැදිලි කිරීම් ප්‍රශ්න කරයි.

බොහෝවිට නව ෂැන්-වර්ගයේ න්‍යෂ්ටික බලයෙන් ක්‍රියාකරන ප්‍රහාරක සබ්මැරීන ද අඩංගු චීන සබ්මැරීන ගැන සොයා බැලීමට ඉම්පෙකබල් සම්බන්ධ වී යැයි එ.ජ. ආරක්ෂක විශ්ලේෂකයෝ පිලිගනිති. මුහුද යට රහස් ඔත්තු උපකරනයක් ඇදගෙනයාමට ඉම්පෙකබල් විසින් පාවිච්චි කරන ලද කේබලයකට දිගු ලීයක් උපයෝගී කර ගෙන බාධා කිරීමට උත්සාහ කරන චීන නාවිකයෙකු පෙන්වන එ.ජ. නාවික හමුදාව විසින් ලබාගත් ඡායාරූපයක් ඉන්ටර්නැෂනල් හෙරල්ඩ් ට්‍රිබියුන් පලකලේය.

ගැටුම් වලක්වාලීමට චීනය සමග නාවික නීති පද්ධතියක් ඇති කර ගැනීමට එ.ජ. සලකා බලාගෙන යන බව එ.ජ. පැසිපික් අනදෙන ප්‍රධානී අද්මිරාල් තිමොති කීටින් ගිය මාසයේදී වාර්තාකරුවන්ට පැවසීය. ඒ සමග ම, කෙසේ වුවත්, චීනයේ නාවික ශක්තිය ඉහල යැම ගැන පෙන්ටගනයේ වැඩෙන සැලකිල්ල ඔහු විස්තර කලේය. පැසිපික් සාගරයේ ක්‍රියාත්මක වන සබ්මැරීන 200 කින් 65 ක්ම චීනයට අයත් බව සඳහන් කරමින් "දැන් ඔවුන් සිටිනා තැන දක්වා දිය යට හැකියාව වර්ධනය කිරීමට චීනය පෙලඹුනේ ඇයිදැයි තේරුම් ගැනීම අපට අවශ්‍යය. ඔවුන්ගේ සබ්මැරීන මාගේ රාත්‍රී නින්දට බාධා කරන්නේ නැති නමුදු, චීන සබ්මැරීන සංවර්ධනය ගැන අපි ඉතා සැලකිල්ලෙන් බලා සිටිමු." කීටින් පැවසීය.

දශක ගනනාවකට චීන නාවික හමුදාව එ.ජ.ට අභියෝග කල හැකි තත්වයේ නොපැවතිනි. මෑත කාලීනව දිග විහිදුම් ගුවන් යානා හා මිසයිල ආධාර ද ඇතුව චීනය වේගවත් කුඩා නැව් මධ්‍ය ප්‍රමානයේ යුද නැව් දිය ගොඩ දෙකෙහිම යාත්‍රා කල හැකි ප්‍රහාරක යාත්‍රා සහ සබ්මැරීන ඇතුලත් තම බලඇනිය පුලුල් කරමින් සිටී. තවමත් ඇමරිකානු නාවික බලයට වඩා අතිශය පහල මට්ටමක පැවතිය ද චීන නාවික හමුදාව වඩ වඩා නවීකරනය වෙමින් පවතියි. 2006 දී චීන සබ්මැරීනයක් යූඑස්එස් කිටි හෝක් නම් ඇමරිකානු ගුවන්යානා රැගෙන යන නැව වෙත රහසේ ලඟාවී මොහොතකින් ඒ අසලින්ම පිටතට පැමිනීම එ.ජ. ආරක්ෂක අංශවල කැලඹීමකට තුඩු දුන්නේය. ගුවන් යානා ගෙනයන තමන්ගේ ම නෞකා සමූහයක් ඉදිකිරීම චීනයේ සැලසුමකි.

ඔබාමා පරිපාලනය චීනයට එක්තරා සහනශීලී ඇඟවුම් දනවන ලදී. රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් පලමු විදේශ සංචාරය සිදුකලේ චීනයට හා ආසියාවටය. ප්‍රතිවිරුද්ධකම් පැවතියේදී පවා දෙරටෙහි ආර්ථිකයන් එකිනෙක හා කිට්ටුවෙන් වෙලී පවතී. දැවැන්ත ලාභ ශ්‍රම වේදිකාවක් ලෙසට එ.ජ. සමාගම් චීනය මත රඳා පවතින අතර තම භාන්ඩ සඳහා ඇති ප්‍රධාන වෙලඳපොලක් ලෙසට එ.ජ. මත චීනය රැඳී සිටී. එ.ජ. බැඳුම්කර මිලදී ගැනීමට එහි විශාල විදේශ විනිමය අතිරික්තය යොදාගැනීම දිගටම කරගෙන යමින් නය බරිත ඇමෙරිකානු මූල්‍ය ක්‍රමය රැක ගැනීමට උදව් වන ලෙසට ක්ලින්ටන් බීජිං උනන්දු කලාය.

මෙවන් උත්සාහයන් තිබියදීත් ආතතීන් කිසි දිනක මතුපිට තලයෙන් අභ්‍යන්තරයට ගියේ නැත. ජනවාරියේදී භාන්ඩාගාර ලේකම් ලෙස තම ස්ථාපනයට පෙරාතුව ම චීනය තම මුදල් වංචා කරන බව තිමොති ගෙයිත්නර් ප්‍රචන්ඩකාරීව චෝදනා කලේය. මෙවන් චෝදනාවක් ක්‍රියාත්මක කල හොත් චීනයට එරෙහිව එ.ජ. නීතිය යටතේ දඬුවම් ලෙස වෙලඳ සම්බාධක පැනවිය හැකිය. ඩිමොක්‍රටික පක්ෂයේ සමහර කොටස් තම රටෙහි සමාජ අසහනය වෙනතකට හැරවීමේ උත්සාහයක් ලෙසට විශේෂිතව ම චීනයට එරෙහිව ආරක්ෂනවාදී හැඟීම කැලඹවීම දැනටමත් පටන් ගෙන ඇත.

කෙසේ වුවත් නාවික සිද්ධීන් හිටි අඩියේ පැන නැගුන ස්වාභාවයක් අත් කර ගැනිනි. බුෂ් පරිපාලනය විසින් තායිවානයට ඩොලර් බිලියන 6.5 ආයුධ වෙලඳම කරගෙනයාම හේතුවෙන් ගිය ඔක්තෝබරයේ දී කපා හැරුනු දෙරට අතර මධ්‍ය පරිමාන මිලිටරි හුවමාරු ප්‍රතිස්ථාපනය ඇගේ සංචාරය අතරතුර ක්ලින්ටන් ප්‍රකාශයට පත්කලාය. දෙරට අතර නිල මිලිටරි සාකච්ඡා නැවත ආරම්භ කර සතියක් යාමට මත්තෙන් එ.ජ.-චීන නාවික අර්බුදය පටන්ගැනුනි.

මෙම ආතතීන් පිටුපස ඇත්තේ, පල්ලම් බසින එ.ජ. ආර්ථික බලය සහ ආසියාවේ හා ජාත්‍යන්තර වශයෙන් ඇමරිකානු අවශ්‍යතාවයන්ට අභියෝගාත්මක රටක් විය හැකි චීනයේ ඉක්මන් නැගීම හේතුවෙන් ඇතිවන, වඩා මූලික භූ-දේශපාලන වෙනස්කම්ය. තමන්ගේ දැවැන්ත නිෂ්පාදන කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා බලශක්ති සම්පාදනය සඳහා පවතින චීනයේ ඉල්ලුම නිසා ඊට තවදුරටත් මැදපෙරදිග, මධ්‍යම ආසියාව, ලතින් ඇමරිකාව හා අප්‍රිකාව වෙතට ඇදෙන්නට බලකෙරී ඇති අතර එමගින් ස්ථාපිත ප්‍රතිවාදීන් වැඩි වශයෙන්ම එ.ජ. කෝපගන්වා ඇත.

අහම්බයක් නොවුනත්, දෙරට අතර උපායමාර්ගයන්හි පැහැදිලි වෙනස්කම් ඇති නාවික විෂයයෙහි ගැටුම් මතුව තිබේ. දෙවන ලෝක යුද්ධයෙන් පසුව, පැසිපික් සාගරය ඇමරිකානු විලක් ලෙසට ඇමරිකානු උපායමාර්ගකරුවන් විසින් සලකනු ලැබිනි. ජපානයේ, දකුනු කොරියාවේ, ගුවාම්හි සහ පිලිපීනයේ ඇමරිකානු මිලිටරි හමුදා රැඳවූයේ සෝවියට් දේශයට සහ චීනයට එරෙහි සීතල යුද පීඩනයේ කොටසක් ලෙසිනි. ඒ සමග ම, එ.ජ. අවශ්‍යතාවයන්ට ප්‍රධාන තර්ජනයක් ලෙසට ජපානයට නැවත හිස ඔසවන්නට නොහැකි වීම සුරක්ෂිත කිරීමේ කොටසක් ලෙස, විශේෂයෙන්ම තෙල් සම්පත් බහුල මැද පෙරදිග සිට,

ප්‍රධාන මුහුදු මාර්ග එ.ජ. විසින් පාලනය කිරීම සිදු කෙරින.

ප්‍රධාන මුහුදු මාර්ග එ.ජ. විසින් පාලනය කිරීම, විශේෂිතව ම තෙල් සහ ගෑස් වැනි අමුද්‍රව්‍යයන්ගේ තම ඉතා වැදගත් සැපයුම් මාර්ගවලට ද, තර්ජනයක් බවට චීනය තදින්ම තේරුම් ගෙන සිටියි. නිල්දිය නාවික හමුදාවක් සහ ඒ ලෙසට ම, "මුතුමාලය" ලෙසින්, මැද පෙරදිග සිට ගිනිකොන දිග ආසියාව හරහා වරායවල් ගනනාවක් ඉදිකරන්නට චීනය ගෙන ඇති තීරනය, මෙම වැදගත් උපායමාර්ගික ගමන් මාර්ගය ආරක්ෂා කිරීම අරමුනු කොට ගෙන ඇත. ඒ අතර ම, නැගෙනහිර චීන මුහුදේ පිහිටි දයෝයුතායි දූපතේ (සෙන්කකු නමින් ජපන් භාෂාවෙන් හඳුන්වන) අයිතිය පිලිබදව, ආසියාවේ ප්‍රධාන එ.ජ. මිතුරා වන, ජපානයේ අභියෝගවලට චීනය මුහුන පා සිටින අතර, දකුනු චීන මුහුදේ ස්ප්‍රැට්ලි හා පැරාසෙල් දූපත් හා ඒ වටා මුහුදු සම්බන්ධව වියට්නාමය හා පිලිපීනය සමග ද චීනයට දිගුකාලීන අර්බුද පවතී.

තමන්ගේ මුහුදු තීරය ආසන්නයට ඇමරිකානු ඔත්තු සේවා නැව් පැමිනීම මගින් චීන මිලිටරිය නොසන්සුන් වුවහොත් දැඩි අස්ථානයක් ගන්නට තීරනය කිරීම පුදුමයක් නොවේ. සෝමාලි මුහුදු තීරයේ සිටින මුහුදු කොල්ලකරුවන්ගෙන් තම නැව් ආරක්ෂා කිරීමට වේගවත් කුඩා නැව් දෙකක් යෙදවීමට ජනවාරියේදී බීජිං ගත් තීරනය, තම ආර්ථික සහ උපායමාර්ගික අවශ්‍යතා රැකගැනීමට තම වැඩෙන මිලිටරි ශක්තිය පාවිච්චි කිරීමට අදහස් කිරීමේ සංකේතයක් විය. කෙසේ වුව ද, කොල්ලකරුවන්ට එරෙහි මෙහෙයුමේ දී, විශේෂිතව ම එ.ජ. සමග මිලිටරි එදිරිවාදිකමක් ඇති නොකරගන්නට, චීනය තම ප්‍රයත්නයන් ඉතා පරිස්සමින් සැලසුම් කර ඇත.

ජපානයේ හා දකුනු කොරියාවේ සිට ගිනිකොන දිග ආසියාව සහ ඔස්ට්‍රේලියාව හරහා ඉන්දියානු උප මහාද්වීපය ඇෆ්ගනිස්තානය සහ මධ්‍යම ආසියාව දක්වා පැතිරෙන, උපායමාර්ගික හවුල් හා සැලසුම් ගනනාවක් තුලින් චීනය වටකරන්නට දැරූ ජනාධිපති බුෂ්ගේ උත්සාහයන් වෙතින් ඔබාමා පරිපාලනය දුරස් වී නැත. ඇමෙරිකානු දේශපාලන සංස්ථාපිතය ඇතුලත, උපායික ක්‍රමවේදයන් වෙනස් වුවද, එ.ජ. අවශ්‍යතාවන්ට ප්‍රධාන අභියෝගයක් ලෙසට චීනය ඉස්මතු වෙමින් පවතින බව සාමාන්‍ය විශ්වාසයයි.

වඩාත් මිලිටරිවාදී ස්ථරයන් අතරේ, එ.ජ.ය චීනය හා ගැටුමකට යා යුතු බවට අදහසක් පවතී. දක්ෂිනාංශික ඇමරිකානු ආයතනය (American Enterprise Institute) මගින් ජනවාරියේදී ප්‍රකාශයට පත්කල අධ්‍යයනයක මෙසේ තහවුරු කෙරේ. "පසුගිය ශතවර්ෂයේ සිටි අස්ථානයේ රැඳී සිටීම ඇමෙරිකානු උපායමාර්ගයේ අවම අරමුන විය යුතුය. එනම් කිසිදු තනි බලයක් හෝ ප්‍රතිවාදී බල එකතුවක් ආසියාවේ බලාධිකාරයට පැමිනීම වලක්වාලීමයි. විශේෂිත ආර්ථික කලාප බිහිකිරීමෙන් හෝ ආසියාවට සහ ආසියාව හරහා අපගේ භෞතික සමීපවීම වලක්වාලමින් කලාපයේ සම්පත් පාලනය කරන්නට ගන්නා කිසියම් උත්සාහයක් මගින් අපගේ ආරක්ෂාවට සහ සුබසිද්ධියට තර්ජනයක් වීමෙන් අනෙකුන් වලකාලීම අවශ්‍යය." වඩාත් විරුද්ධවාදී බලවේගය චීනය බව බුද්ධි කවයේ නිගමනය විය.

ඉරුදින නාවික සට්ටනයට, විශේෂිත වූ යුදවාදී ආකල්පයක් ගත් අඟහරුවාදා වෝල් ස්ට්‍රීට් ජර්නලයේ කතෘ වාක්‍යය මෙසේ පැවසීය. "ඉම්පෙකබල් සමග ඇතිවූ සිද්ධිය කලාපයේ ආධිපත්‍යය සහ එ.ජ. බලපෑම අවමකරන්නට චීනයේ අභිලාෂයන්, නව ඇමෙරිකානු පරිපාලනය යටතේ පවා, නොවෙනස් බවට තවත් මතක් කිරීමකි. ඉම්පෙකබල් මෙම මුහුදෙහි යාත්‍රා කරන ඊලඟ අවස්ථාවේදී, (චීනයේ ප්‍රකෝපකාරිත්වයට ඉක්මන් පිලිතුරක් ලෙසට මෙය ඉක්මනින් කල යුතුය), කුඩා යුද නැව් එකක් හෝ දෙකක් ආරක්ෂාව සඳහා යැවීමට ජනාධිපති ඔබාමා තීරනය කල යුතුය."

එ.ජ.ය-චීනය අතර සුලු නාවික සටන එලිපත්තට ගෙනාවේ, ගැඹුරුවන ගෝලීය මන්දාවදමනය නිසා තවත් ගිනිගන්නා සුලු බවට පත් වූ, ආසියාවේ සහ ජාත්‍යන්තරයේ ආර්ථික සහ උපායමාර්ගික ප්‍රතිවිරුද්ධතාවයන්වේ. භයානක වන්නේ, හවුල්වන ප්‍රධාන නලුවන්ගේ මුල් සැලැසුම්වලට අදාල නොවන, නොසැලකිය යුතු තරම් වූ, කිසියම් සිද්ධියක, වඩා පුලුල් වූ අර්බුදයක් නිර්මානය කිරීමට විභවයක් ඇති බවයි.

© www.wsws.org